# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

## බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කිරීම
## 2026/2027 අධ්‍යයන වර්ෂය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මඟින් පිරිනමනු ලබන පහත සඳහන්
බාහිර උපාධි පාඨමාලා සඳහා
**2026-06-10 වන දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.**

**මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය මඟින් ඉදිරිපත් කරනු ලබන බාහිර උපාධි පාඨමාලා**

- ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
- සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

**කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය මඟින් ඉදිරිපත් කරනු ලබන බාහිර උපාධි පාඨමාලා**

- විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව



**සැලකිය යුතුයි !!**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට අනුබද්ධ කිසිදු නියෝජිත ආයතනයක් නොමැත. එබැවින් අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා external.sjp.ac.lk යන වෙබ් අඩවියට පිවිස උක්ත සඳහන් ක්‍රමවේදය පමණක් අනුගමනය කළ යුතුය. වෙනත් නියෝජිතායතන හරහා ඉදිරිපත් කරන අයදුම්පත් පිළිබඳව විශ්වවිද්‍යාලය වගකියනු නොලැබේ.

## අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය

අයදුම්පත් මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ පමණක් ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව external.sjp.ac.lk වෙබ් අඩවියට පිවිස නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත යොමු කළ (Submit) යුතුය.

**අයදුම්පත යොමු කිරීමේදී පහත සඳහන් ලේඛන ස්කෑන් කර (Scan) උඩුගත කළ යුතුය.**

- සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපතක්.
- අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද පිටපත්.
- ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද පිටපතක්.
- අයදුම්පත් ගාස්තුවට අදාලව බැංකුවට මුදල් ගෙවන ලද රිසිට්පතේ මුල් පිටපත හෝ Visa හෝ Master debit / credit කාඩ්පත් මගින් ගෙවීම් කරන්නේ නම් ගෙවීම් කල බව තහවුරු කිරීමේ මුද්‍රිත සාක්ෂි සටහනක් (Online receipt)

ඉහත සඳහන් ලේඛනවල පිටපත් සමග සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි දෘඪ පිටපතක් (Hard copy) පහත සඳහන් ලිපිනයට 2026-06-10 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (සැ. යු. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ හි තමා ඉල්ලුම් කරන උපාධි පාඨමාලාවේ නම සඳහන් කර එවිය යුතුය)

**අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය**
නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
අංක 16, එස් ඩී එස් ජයසිංහ මාවත,
කොහුවල, නුගේගොඩ

- ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- එක් අයදුම්කරුවකුට උපාධි පාඨමාලා කිහිපයකට අයදුම් කළ හැකිය.
- ඒ සඳහා අයදුම්පත් ගාස්තුව වෙන් වෙන්ව ගෙවීම් කර අයදුම්පත් යොමු කළ යුතුය.

**උපාධි පාඨමාලා විස්තර, ගෙවීම් සිදු කිරීම සහ අයදුම්පත් යොමු කළ යුතු ආකාරය ඇතුලු සියලු විස්තර සඳහා පිවිසෙන්න**
**external.sjp.ac.lk**

ලේඛකාධිකාරී
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
2026.05.10

COMMERCIAL DISTRIBUTION IS STRICTLY PROHIBITED
PRINTED FROM PRESSREADER
NOT FOR SALE
PERSONAL COPY